යුරෝපයේ ආසාදිතයන් තවත් ඉහළට

■ සහන් වික්‍රමගේ

කොවිඩ් වසංගතයේ කේන්ද්‍රස්ථානය බවට නැවතත් පත්ව ඇත්තේ යුරෝපයයි. බටහිර යුරෝපයේ රටවල් අතරින් ජර්මනිය තුළ වසංගතය වඩාත් දරුණු තත්ත්වයකට පත්ව තිබේ. තම රට පත්ව සිටින බේදජනක තත්ත්වය ගැන සඳහන් කරමින් එරට චාන්සලර්වරිය වන ඇන්ජෙලා මර්කල් පවසා ඇත්තේ ජර්මනිය බිහිසුණු සිව් වැනි රැල්ලක ග්‍රහණයට නතුව ඇති බවය. ඇය මෙම ප්‍රකාශය කර ඇත්තේ එරට දෛනික ආසාදිතයන් සංඛ්‍යාව වේගයෙන් ඉහළ යමින් ඇති පසුබිමකය.

පසුගිය බදාදා (17 වැනිදා) එරටින් නව ආසාදිතයන් 52,826 දෙනෙකු වාර්තා වී තිබිණි. පසුගිය වසරේ වසංගතය ආරම්භ වීමෙන් පසු ජර්මනියෙන් දිනක් තුළ වාර්තා වූ වැඩිම ආසාදිතයන් සංඛ්‍යාව මෙයයි. තත්ත්වයෙහි බරපතළ බව මේ තුළින් ඉතා හොඳින් තේරුම්ගත හැකිය. දෛනික මරණ සංඛ්‍යාවද පසුගිය දිනවල 200ට වැඩි අගයක් ගෙන තිබිණි. මර්කල් තව දුරටත් පවසා තිබුණේ එරට රෝහල්වල දැඩි සත්කාර ඒකක වේගයෙන් පිරී යමින් ඇති බවය. ඒ නිසා කිසියම් හදිසි තත්ත්වයක් පැන නගිමින් ඇති බවක් ද ඇය අවධාරණය කර තිබුණාය.

ජර්මනියේ මෙන්ම යුරෝපයේ තවත් බොහෝ රටවලද වසංගතය සම්බන්ධයෙන් පවතින්නේ අස්ථාවර තත්ත්වයකි. 'සියලුම අනතුරු ඇඟවීමේ සංඥා රතු පාටට හැරිලා' එසේ පවසා තිබුණේ බෙල්ජියමේ අගමැති ඇලෙක්සැන්ඩර් ඩි කෘය. 'මුළු යුරෝපයේම සිතියම වේගයෙන් රතු පාට වෙමින් තිබෙනවා. අපිත් ඊට ඇතුළත්' යයිද ඔහු තවදුරටත් පවසා තිබිණි.

බෙල්ජියම තුළද සෞඛ්‍ය සීමා දැඩි කිරීමට මේ වනවිට රජය පියවර ගනිමින් සිටියි. සතියේ දින හතරක් නිවෙස්වල සිට රැකියා කිරීමට පියවර ගන්නා ලෙස රජය ජනතාවට දැනුම් දී ඇත. එමෙන්ම මුණ ගැසීම් අවම කරන මෙන්ද අගමැතිවරයා ඉල්ලීමක් කර තිබිණි. සිනමා ශාලා, නාට්‍ය ශාලා, කෞතුකාගාර වැනි ස්ථානවලට පැමිණෙන අය තමුන් එන්නත් ලබාගෙන ඇති බව තහවුරු කළ යුතුය.

ආනයන හැකි උපරිමයෙන් අඩු කළ යුතු බව ඉන්දීය මුදල් ඇමැතිනිය කියයි

■ ධම්මික සෙනෙවිරත්න

අත්‍යවශ්‍ය ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීමට තව තවත් නිෂ්පාදන ආයතන ඇරඹීම කෙරෙහි යොමුවිය යුතු බවත් එමගින් අනාගතයේදී ආනයන මත යැපීමේ අවදානම අඩු කර ගත හැකි වනු ඇති බවත් ඉන්දීය මුදල් ඇමැතිනිය නිර්මලා ශ්‍රීධරන් කියා සිටී. වසංගතය සැපයුම් දමයට ඇති කර තිබෙන බාධාකාරී බලපෑම් සහ අත්‍යවශ්‍ය භාණ්ඩ ආනයනය මත යැපීමට සිදුව තිබීම කෙරෙහි අවධානය යොමු කරන විට ඉන්දියාව වඩ වඩාත් ස්වයං විශ්වාසයෙන් කටයුතු කිරීමට සිදුව ඇතැයිද ඇය පවසයි. ගෝලීය ජාල සමග සම්බන්ධ වී සිටියද එමගින් තම

රටට එල්ල කර ඇති බලපෑම් ගැන දැනුම්වත්ව සිටිය යුතු බව සහ ඒ අනුව ක්‍රියා කළ යුතු බව ඇය පෙන්වා දේ. වසංගතයේ බලපෑමට ලක් වූ මුල් අදියරේදී පරීක්ෂණ කට්ටල සහ ආරක්ෂක උපාංගද ආනයනය කිරීමට ඉන්දියාවට සිදුවිය.

අවදානම භාර ගනිමින් කර්මාන්ත යළි පණ ගැන්වීමට කටයුතු කළ යුතු බව ඇයගේ අදහසය.

NEWS IN BRIEF

- දරුණු සුළි කුණාටුව නිසා කැනඩාව හදිසි තත්ත්වයක් ප්‍රකාශයට පත් කරයි.
- පාකිස්තානයේ ලාහෝර් නුවරත් වායු ගෝලය තදින් දූෂණය වෙලා.
- මෙල්බන් දෛනික ජීවිතය යළි යථා තත්ත්වයට පත්වෙයි.

එතෙර අරුණ



හමුදා පාලනයට එරෙහිව මියන්මාර ගුරුවරු හා සිසුහු පාසල් පැමිණීම වර්ජනය කරති

■ සහන් වික්‍රමගේ

කොවිඩ් වසංගතය නිසා පසුගිය කාලයේ වසා තිබූ මියන්මාරයේ පාසල් නැවත විවෘත කිරීමට එරට හමුදු රජය පියවර ගෙන ඇතත් ගුරුවරුන් සහ සිසුන් විශාල පිරිසක් පාසල් නොපැමිණෙන බව වාර්තා වේ. ගුරුවරුන් සහ සිසුන් මේ ආකාරයෙන් පාසල් යාමෙන් වැළකී සිටින්නේ එරට හමුදු කුමන්ත්‍රණයට සහ හමුදු පාලනයට විරෝධය දැක්වීම සඳහාය. 'මේ වනවිට පාසල් පාලනය කරන්නේ හමුදුවයි. ඒ නිසා විප්ලවවාදියෙකු හැටියට මම මගේ දරුවන් කිසිවකු පාසල් යවන්නේ නැහැ' යැයි එක් පියකු ප්‍රකාශ කර තිබිණි. ඔහුගේ එක් දරුවකු ප්‍රාථමික පාසලකද, තවත් දරුවන් දෙදෙනෙකු ද්විතීයික පාසලකද අධ්‍යාපනය ලබයි.

හමුදුව රට පාලනය කරනතුරු තමා දරුවන් පාසල් නොයවන බව ඔහු ප්‍රකාශ කර තිබිණි. 'අපි අපේ දරුවන් පාසල් යවන්න තීරණය කළොත් එය හමුදුවට සහය දැක්වීමක් හා සමානයි. මම දරුවන් පාසල් යවන්නේ වෙනත් පාර්ශ්වයක් රටේ පාලනයට පත් වූ විට පමණයි' ඔහු තවදුරටත් පවසා තිබිණි. මේ ආකාරයෙන් පාසල් වර්ජනය කිරීම හමුදු පාලනයට එරෙහිව විරෝධය දැක්විය හැකි ප්‍රබල ආකාරයක් බව ඔහුගේ විශ්වාසයයි.

මියන්මාර හමුදුව එරට පැවැති සිවිල් පාලනය පෙරළා දමා බලය අල්ලා ගත් පසු හමුදු පාලනයට එරෙහිව රට තුළ දැවැන්ත විරෝධතාවක් දියත් වූ අතර බොහෝ රජයේ සේවකයෝ සේවයට වාර්තා කිරීමෙන්ද වැළකී සිටියහ. ගුරුවරුන්ද එහි පෙරමුණේම සිටි පාර්ශ්වයක් විය. මෙම වර්ජනයට සහය නොදුන් ගුරුවරුන් ඉලක්ක කර මේ වනවිට ප්‍රහාර එල්ල වන බවක්ද වාර්තා වේ. මාධ්‍ය සඳහන් කරන අන්දමට මෙම ප්‍රහාර එල්ල කරන්නේ හමුදු පාලනයට එරෙහි ඇතැම් සන්නද්ධ කණ්ඩායම්ය.

මුස්ලිම් ජනයා එන්නතට දිරිමත් කරන්න සල්මන් බාන් පෙරට එයි

■ සහන් වික්‍රමගේ

ඉන්දියාවේ මුස්ලිම් ජනතාව කොවිඩ් එන්නත් ලබා ගැනීම සඳහා මැලිකමක් දක්වන බව පෙනී යාමත් සමග එම ජනතාව එන්නත්කරණයට පොළඹවා ගැනීම සඳහා සුපිරි නළු සල්මාන් ඛාන් සියලු දෙනාට නොපමාව එන්නත් ලබා ගන්නා ලෙස පවසමින් වීඩියෝවක් නිකුත් කර තිබේ. මහාරාෂ්ට්‍රය ඉන්දියාවේ එන්නත්කරණය අතින් ඉදිරියෙන්ම සිටින ප්‍රාන්තයකි. නමුත් එහි මුස්ලිම් ජනතාව වැඩි වශයෙන් ජීවත්වන ප්‍රදේශවල එන්නත් ලබා ගැනීමේ අඩුවක් දක්නට ලැබෙන බව අනාවරණය වී තිබිණි. සල්මාන්ගේ වීඩියෝව කරළියට එන්නේ මෙම පසුබිම තුළය. හැකි ඉක්මනින් කොවිඩ් එන්නත ලබා ගන්නා ලෙසත්, ඒ මගින් රට තුළ වසංගතය අවසන් කිරීමට දායක වන ලෙසත් ඔහු සියලු දෙනාගෙන් ඉල්ලීමක් කර තිබේ.

රටේ හැම දෙනාටම එන්නත් ලබා දීමට රජය සියලු පියවර ගනිමින් සිටින බව ද, එන්නත් ගැන බොරු කටකතා පැතිරවීම නතර කළ යුතු බවද සල්මාන් මෙහි ප්‍රකාශ කරයි. 'කොරෝනා රැලි පිට පිටම වාගේ පැතිරෙමින් තිබෙනවා. මෙය මර්දනය කිරීමට තිබෙන එකම විසඳුම එන්නත බව මේ වනවිට අප අවබෝධ කරගෙන සිටිනවා. ඒ අතර එන්නත් ගැන බොහෝ කටකතා පැතිරෙමින් ඇති බවත් අප දන්නවා. මේ නිසා එන්නත්වලට යම් විරෝධයකුත් පැතිරෙමින් තිබෙනු දකින්න පිළිවන්. කොරෝනා එන්නත් ගැන මෙවැනි කටකතා පැතිරවීමෙන් වළකින්නැයි මුලින්ම මම ඉතා වුවමනාවෙන් ඉල්ලා සිටිනවා' යැයි සල්මාන් සඳහන් කරයි.

ඉන්දියාව මාස අටකට පසු කොරෝනා එන්නත් අපනයනය අරඹයි

■ නයන තරංග ගමගේ

මාස 08කට පසු ඉන්දියාව නැවතත් කොවිඩ් - 19 වයිරසයට එරෙහි එන්නත අපනයනය ආරම්භ කර තිබේ. ඒ අනුව පළමු එන්නත් තොග මියන්මාරයට, බංග්ලාදේශයට, නේපාලනයට සහ ඉරානයට අපනයනය කර තිබේ. පසුගිය වකවානුවේ රට තුළ කොවිඩ් - 19 වසංගතය ව්‍යාප්ත වීමත් ඊට සමගාමීව දේශීය එන්නත් අවශ්‍යතාව ඉහළ යෑමත් හේතුවෙන් ඉන්දියාව කොවිඩ් - 19 එන්නත් අපනයනය තාවකාලිකව අත්හිටුවා තිබිණි. එන්නත් අපනයනය කිරීමේ පළමු වැඩසටහන තාවකාලිකව අත්හිටුවන විට ඉන්දියාව සිය කොවිඩ් - 19 එන්නත් මාත්‍රා බිලියනයකට අධික සංඛ්‍යාවක් අපනයනය කර තිබිණ.

එතෙක් වාණිජමය වශයෙන් නිෂ්පාදනය කෙරුණු එන්නත් අප්‍රේල් මාසයේ ආරම්භ වූ කොවිඩ් රැල්ලෙන් අනතුරුව දේශීය

අවශ්‍යතා වෙනුවෙන් යෙදවීමට ඉන්දියාව තීරණය කළේය. මේ අතර ලෝක සෞඛ්‍ය සංවිධානයේ කොවැක්ස් වැඩසටහන හරහා 'සීරම්' ආයතනයේ නිෂ්පාදිත කෝෂිල්ඩ් ඇස්ට්‍රාසෙනෙකා එන්නත් තොගයක් අප්‍රිකානු රටවලට අපනයනය කිරීමටද ඉන්දියාව කටයුතු කර ඇත. සීරම් ආයතනයේ ප්‍රධානී අධාර් පූනවෙලා ප්‍රකාශ කර ඇත්තේ එම එන්නත් තොගය පසුගිය නොවැම්බර් 10 වැනි දිනට පෙර අප්‍රිකාවට යොමු කර ඇති බවය. එසේම එන්නත් මාත්‍රා මිලියන 30 බැගින් මාසිකව කෝවැක්ස් වැඩසටහටන ලබා දීමටද සීරම් ආයතනය සූදනමින් පසු වේ.

කාගිල්ස් ෆුඩ්සිටි 38 වසරක අභිමානය

කාගිල්ස් ෆුඩ්සිටි ආරම්භයේ සිටම ක්‍රියාත්මක වී ඇත්තේ සිය පාරිභෝගිකයන් හට අඩුම මිලට වැඩිම වටිනාකමක් ලබා දෙන අතරේ ගොවීන්ට සහ සුළු පරිමාණ ව්‍යාපාරකයින්ට වෙළෙඳපොළක් නිර්මාණය කිරීම අරමුණු කරගනිමිනි. සුපිරි වෙළඳසැල්

අත්දැකීම ඉහළ පැළැන්තියට පමණක් සීමා වූ කාල වකවානුවක් වන 1983 වසරේ සිය මෙහෙයුම් ආරම්භ කළ ෆුඩ්සිටි වෙළෙඳසැල් ජාලය සමස්ත මහජනතාවට මෙම අත්දැකීම සමීප කරදීමේ පුරෝගාමියා බවට පත්වුණි. ආරම්භයේ පටන්ම ෆුඩ්සිටිහි අරමුණ වූයේ වූයේ සිය පාරිභෝගිකයන්ගේ ජීවන වියදම අඩු කිරීමය. මෙම අරමුණ ඉටු කිරීම වෙනුවෙන් විවිධ වැදගත් ආයෝජනයන් සිදු කර ඇති අතර මේ වනවිට සමාගම සතුව ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක 25 තුළ ක්‍රියාත්මක වන ශාඛා 471 පවතී. පළමු ශාඛාව 1983 දී ස්ටේප්ල්ස් මාවතේදී ද, 100 වන ශාඛාව 2007 දී කළුතරදී ද, 200 වන ශාඛාව 2013 දී පිළියන්දලදී ද, 300 වැනි ශාඛාව 2016 දී ඇල්පිටියේදී ද, 400 වැනි ශාඛාව 2019 වත්තලදී ද විවෘත කරන ලදී.

කාගිල්ස් සිය වෙළෙඳම් ජාලය අංශ තුනක් කරා යොමු කර ඇත. ඒවා නම් ෆුඩ්සිටි සුපිරි වෙළෙඳසැල්, කාගිල්ස් එක්ස්ප්‍රස් වෙළෙඳසැල් සහ කාගිල්ස් ෆුඩ්හෝල් වෙළෙඳසැල්ය. එසේම ඉහළ යන ඔන්ලයින් ඉල්ලුමට සරිලන්නට කාගිල්ස් ඔන්ලයින් ආරම්භ කරනු ලැබුවේ 2020 දීය. අද වනවිට ෆුඩ්සිටි රටේ සුපතල නාමයක් බවට පත්වී ඇත්තේ විශ්වසනීය ප්‍රමිතිය, දිවයින පුරා හැමතැන ව්‍යාප්තව තිබීම, පහසුව සහ අඩුම මිල වෙනුවෙන් දැරූ විශ්වාසය නිසාවෙනි. අද වන විට ෆුඩ්සිටිහි අඩුම මිල සහතිකය දිවයින පුරා මිල ගණන් සම්බන්ධයෙන් මිනුම් ලකුණක් බවට පත්ව ඇත. දේශීය ගොවි ප්‍රජාවට සවිමත් වෙළෙඳපොළක් නිර්මාණය කිරීමට අමතරව සමාගම විසින් කෘෂි නිෂ්පාදන ඉහළ නැංවීමටද සැලකිය යුතු ආයෝජනයන් සිදු කර ඇත. සිය කෘෂි නවීකරණ ව්‍යාපෘතිය හරහා කාගිල්ස් ෆුඩ්සිටි යහපත් කෘෂි පිළිවෙත්හ ඳුන්වා දෙමින් ගොවියන්ට වැඩි ඵලදාවක් සහ වැඩි ආදායමක් පමණක් නොව වඩාත්සෞ ඛ්‍යාරක්ෂිත යහපත් පෝෂණය සපිරි අස්වැන්නක් නෙළා ගන්නට මග පෙන්වයි. සමාගම ගොවීන්ට පුහුණු වැඩසටහන් සැපයීම සඳහාද ආයෝජනය කරන අතර මේ යටතට ජාත්‍යන්තර යහපත් කෘෂි පිළිවෙත් පිළිබඳවද ඔවුන් දැනුවත් කරන්නේ ඒවා සජීවීව අත්විඳීමට පවා අවස්ථාව උදා කරදෙමිනි. කෘෂි නවීකරණ ව්‍යාපෘතියේ වැදගත්ම ප්‍රතිඵලයක් ලෙස කාගිල්ස් ෆුඩ්සිටිහි අලෙවි කෙරෙනා 'ගුඩ් හාවස්ට්' හැඳින්විය හැකිය. මේවා වගා කරනු ලබන්නේ GAP සහතිකය (යහපත් කෘෂි පිළිවෙත්) ලැබූ ගොවියන් විසිනි. එසේම BeeSafe නාමය යටතේ කාගිල්ස්හි 100% ක් කෘෂිරසායන වලින් තොර නැවුම් අස්වැන්න මිලදී ගැනීමේ හැකියාවද පවතී. එසේම කාගිල්ස් සිය ගොවි ප්‍රජාවගේ පවුල්වලටද සහයෝගය ලබාදෙන්නේ එම දරු දැරියන්ට අධ්‍යාපන ශිෂ්‍යත්ව සහ ලැප්ටොප් සපයන අරමුදලක් හරහාය. එසේම ගොවීන්ව අස්වැන්න පාළුවීමෙන් ඇතිවන අලාභයෙන් ආරක්ෂා කිරීමට ණය රක්ෂණ වැඩසටහනක්ද මේ වන විට හඳුන්වා දී ඇත.

වාණිජ පුවත්

කොළඹ වරාය නගරයෙන් දළ දේශීය නිෂ්පාදිතයට ඩොලර් බිලියන 13.8 ක් එකතු විය හැකි බව PWC පවසයි

PwC සමාගම, කොළඹ වරාය නගර ව්‍යාපෘතිය සම්බන්ධ තම නවතම වාර්තාව පසුගියදා ආර්ථික කොමිසම හමුවට ඉදිරිපත් කළේය. සාර්ව ආර්ථික විචල්‍යයන් 5 කට, එනම් රැකියා නියුක්තිය, දළ දේශීය නිෂ්පාදිතය, සෘජු විදේශ ආයෝජන, ගෙවුම් ශේෂය සහ රජයේ ආදායම යන අංශවලට, කොළඹ වරාය නගර ව්‍යාපෘතිය මගින් ලැබෙනු ඇති දායකත්වය මෙම වාර්තාව තුළදී විශ්ලේෂණයට ලක්කර තිබේ.

මෙම අධ්‍යයනයේ මුල් වාර්තාව 2020 වර්ෂයේදී පිළියෙල කරන ලද අතර, එහි 2021 නොවැම්බර් යාවත්කාලීන කිරීම මගින්, කොළඹ වරාය නගරය 'විශේෂ ආර්ථික කලාපයක්' බවට පත්කිරීම සහ, එහි ව්‍යාපෘති සමාගම වන CHEC Port City Colombo (පුද්.) සමාගම ක්‍රියාවට නංවා ඇති පංච වාර්ෂික ක්‍රමෝපාය මගින් ඇතිවන සාධනීය බලපෑම් ගවේෂණය කර ඇත.

පවතින කොවිඩ් වසංගත තත්ත්වයන් හමුවේ මෙරට තොරතුරු සන්නිවේදන හා සන්නිවේදන තාක්ෂණ කර්මාන්ත අංශයේ ආර්ථිකමය දායකත්වය ඩොලර් බිලියන 1.2ක් (billion) දක්වා ඉහළ ගොස් ඇති බවට 'Sri lanka:Asia's next IT/ITES destination' වාර්තාව පෙන්වා දෙයි. මෑත කාලයේ තොරතුරු තාක්ෂණික අංශයේ ක්‍රමික වර්ධනයක් පෙන්නුම් කළ අතර එය තවදුරටත් ඉදිරියට යමින් ඩිජිටල් තාක්ෂණ අංශයේ පුද්ගල, ආයතනික හා කර්මාන්ත සඳහා ජාතික මට්ටමින් ඉහළ පිළිගැනීමකට මගපාදමින් වේගවත් ගමනකට පිවිස ඇති බව මෙම වාර්තාව සඳහන් කරයි. 2020 විද්‍යුත් රාජ්‍ය ස්ථාවරත්වය, සෞඛ්‍යය, කුසලතා, නිෂ්පාදන වෙළෙඳපොළ. ශ්‍රම වෙළෙඳපොළ වැනි ශක්තිමත් සමාජ, ආර්ථික කුලුනු මත මෙහෙයවනු ලබන සමතුලිත සංවර්ධනයක් අත්කර ගත් දකුණු ආසියාවේ එකම රට ශ්‍රී ලංකාව ලෙස මෙමගින් තහවුරු කරයි. එමෙන්ම ඊ-රාජ්‍ය දර්ශකයට (e-government Development Index) අනුව 2018 ශ්‍රී ලංකාව

තොරතුරු සන්නිවේදන හා සන්නිවේදන තාක්ෂණ කර්මාන්ත අංශයේ ආර්ථිකමය දායකත්වය ඩොලර් බිලියන 1.2ක් දක්වා ඉහළට

JLL-ICTA වාර්තාව පෙන්වා දේ

94 වැනි ස්ථානයේ පසුවූ අතර 2020 වනවිට එය 85 දක්වා ඉදිරියට ගොස් තිබේ. එම ඇගයුම් සඳහා මෙරට මූල්‍ය පද්ධතිය, වෙළෙඳපොළ ප්‍රමාණය, ව්‍යාපාරවල ස්වභාවය සහ නවෝත්පාදන හැකියාවන්ද පාදක කරගෙන තිබේ.

Ex-Pack සමාගම 2021 ප්‍රථම අර්ධය තුළ ඉහළ මූල්‍ය ප්‍රතිඵල වාර්තා කරයි

ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ කොරුගේටඩ් ඇසුරුම් (Corrugated carton) නිෂ්පාදන සමාගමක් වන Ex-Pack Corrugated Cartons සමාගම, 2021 සැප්තැම්බර් 30 දිනයෙන් අවසන් වූ මාස 6ක කාලය (2021/22 මූල්‍ය වර්ෂයේ ප්‍රථම අර්ධය) තුළ විශිෂ්ට මූල්‍ය ප්‍රතිඵල වාර්තා කරගැනීමට සමත් වී තිබේ. පසුගිය වසරේ අදළ කාලසීමාවේදී රු. බිලියන 2.065ක ආදායමක් වාර්තා කළ එම සමූහය, මෙම වසරේදී එය රු. බිලියන 3.465 දක්වා 59%කින් වර්ධනය කරගැනීමට සමත් වී ඇත. අප්‍රේල් සහ මැයි මාසවලදී නිෂ්පාදන කටයුතුවලට බාධා එල්ල වූ තත්ත්වයක් හමුවේ පවා මෙම ආදායම වාර්තා කරගෙන තිබීම විශේෂත්වයකි. පසුගිය වසරේ අදළ කාලසීමාව තුළ රු. බිලියන 1.460ක් වූ සමාගමේ පිරිවැටුම, මෙම වසරේදී රු. බිලියන 2.319 දක්වා වර්ධනය වී ඇත. නිෂ්පාදන ප්‍රමාණයන්

සත්තාර් කාසිම් සභාපති

සුල්ෆිකර් ගවුස් කළමනාකාර අධ්‍යක්ෂ

අතින් ගත්විට, අපේක්ෂිත වර්ධනය වූ 7.7% ඉක්මවා යමින්, පෙර වසරට සාපේක්ෂව මෙම වසරේ ප්‍රථම අර්ධය තුළ 17.4%ක වර්ධනයක් වාර්තා කිරීමට සමාගම සමත් වී තිබේ.

Ex-Pack හි අනුබද්ධ සමාගම වන නෙප්චූන් පේපර්ස් (පුද්.) සමාගම (Neptune Papers (Private) Limited) ද මෙම විශ්ලේෂණයට අදළ කාලසීමාව තුළ 13%ක වර්ධනයක් පෙන්නුම් කර ඇත.

සෙලාන් බැංකුවෙ ඉස්ලාමීය බැංකුකරණ ඒකකයට SLIBFI සම්මානයක්

සුහද හදක් ඇති දේශීය බැංකුව, සෙලාන් බැංකුව 2020 Sri Lanka Islamic Banking and Finance Industry (SLIBFI) Awards සම්මාන උළෙලේදී 'වසරේ නැගී එන ආයතනය' (Emerging Entity of the Year) ලෙස සම්මානයෙන් පිදුම් ලැබීමට සමත් විය. SLIBFI සම්මාන මෙරට ඉස්ලාමීය බැංකු හා මූල්‍ය සේවා ක්ෂේත්‍රය සම්බන්ධ ප්‍රමුඛතම සම්මාන වැඩසටහන ලෙස සැලකේ.

විශේෂ ගනුදෙනුකරුවන් කාණ්ඩවල ඉල්ලීම් සපුරාලීම සම්බන්ධ ක්‍රමෝපායික දැක්මයටතේ, මෙරට

සමීර් මොහොමඩ් ඉස්ලාමීය බැංකුකරණ ඒකකයේ ප්‍රධානී

ඉස්ලාමීය බැංකුකරණ සේවාවන් අපේක්ෂා කරන ගනුදෙනුකරුවන් වෙනුවෙන් 2018 වසරේදී සෙලාන් බැංකුවේ ඉස්ලාමීය බැංකුකරණ ඒකකය ආරම්භ කරන ලදී. මේ වනවිට එම ඒකකයේ ආදායම්, වත්කම් හා ණය සේවා පදනම කැපී පෙනෙන වර්ධනයක් අත්පත් කරගෙන ඇත.

2020 වසරේදී එම ඒකකයේ ආදායම 100%කින් ඉහළ ගිය අතර, වත්කම් සහ ණය සේවාවන්ද එවැනිම වර්ධනයක් සනිටුහන් කිරීමට සමත් වී තිබේ.

එමිරේට්ස් වෙතින් රුපියල් 59,300 කින් ආරම්භ වන විශේෂ ගුවන් ගාස්තු මාලාවක්

ගෝලීය සහ කලාපීය වශයෙන් සංචාරක ගමන් සීමාවන් ලිහිල් වීම හමුවේ දිගු කාලයක් සිදුකිරීමට නොහැකි වූ තම ගුවන් ගමන් සිදුකිරීමට ශ්‍රී ලාංකිකයන්ට ආරාධනා කරමින් එමිරේට්ස් ගුවන් සේවය තවත් විශේෂ ගාස්තු ප්‍රවර්ධනයක් ආරම්භ කර තිබේ.

නොවැම්බර් 09 වැනිදා සිට 21 වැනිදා දක්වා මිලදී ගන්නා ගුවන් ටිකට්පත් සඳහා මෙම විශේෂ සහන ගාස්තු හිමිවන අතර 2021 දෙසැම්බර් 01 වැනිදා සිට 2022 මාර්තු 31 වැනිදා දක්වා එමිරේට්ස් ජාලයේ ගමනාන්ත 120ක් වෙත ගමන් කිරීම සඳහා මෙම ගුවන් ටිකට්පත් වලංගු වන බව සම්මානනීය ගුවන් සමාගම සඳහන් කරයි.

මෙම ප්‍රවර්ධන වැඩසටහන ඉකොනොමි සහ ව්‍යාපාරික පන්තියේ මගීන් සඳහා වලංගු වන අතර ඉකොනොමි පන්තියෙන් ඩුබායි වෙත ඇමරිකානු ඩොලර් 292කින් (වත්මන් විනිමය අනුපාතයට අනුව ආසන්න වශයෙන් රුපියල් 59,300ක් පමණ) මෙම විශේෂ ගාස්තු ආරම්භ වේ.